## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

කටුනායක සීදූව නගර සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය,ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට කටුනායක සීදූව නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රමිතියේ අංක 3.29 හා එහි පරිශිෂ්ඨය 2 හා පහදාදීම් හා මඟපෙන්වීම්හි EG 6.3 ප්‍රකාරව ආයෝජන ක්‍රියාකාරකම්වලින් වූ මුදල් ප්‍රවාහය ගණනය කිරීමේදී සේවක ණය ලබා දීම් රු.14,724,711ක් හා ණය ආපසු ලැබීම් රු.12,261,613ක් වෙන වෙනම දැක්විය යුතු වුවත් එම වටිනාකම් හි ශුද්ධ අගය පමණක් දක්වා තිබුණු අතර දේපල පිරියත හා උපකරණ මිලදීගැනීම් රු.32,991ක් අඩුවෙන් දක්වා තිබුණි. | එම වරද එසේ සිදු නොකිරීමට වග බලා ගන්නා බව. | ප්‍රමිතියට අනුකූලව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කළ යුතුය. |

1.6.2 **ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචන වර්ෂයේ අවසාන දිනට ලැබිය යුතු කසල ගාස්තු ආදායම වූ රු.2,548,000ක් ලැබිය යුතු ප්‍රාග්ධන ප්‍රදාන ගිණුමෙහි දක්වා තිබුණි. | ඉදිරියේදී වෙනම ගිණුමකට මාරු කර දැක්වීමට කටයුතු කරන බව. | ගිණුම්ගත කිරීම් නිවැරදිව සිදු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී රු.31,972ක පුස්තකාල පොත් ඉවත් කිරීමට අදාල ක්ෂය රු10,996ක් ක්ෂය වෙන් කිරීමේ ගිණුමෙන් ඉවත් කළ යුතු වුවත් රු.13,040ක් ඉවත් කර තිබුණි. | ඉදිරි වර්ෂයේදී මෙම දෝෂය ද නිවැරදි කිරීමට කටයුතු කරන බව. | -එම- |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ලැබිය යුතු ප්‍රාග්ධන ප්‍රදාන රු.50,394ක් ගිණුම් ගත කර නොතිබීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් ලැබිය යුතු ප්‍රාග්ධන ප්‍රදාන ශේෂය වැඩියෙන් දක්වා තිබුණි. | ඉදිරි ගිණුම් වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | -එම- |

1.6.3 **නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ සමඟ ඉදිරිපත් කළ උපලේඛනවල එකතු හා මූල්‍ය ප්‍රකාශවල ගිණුම් 03 ක ශේෂයන් අතර රු. 775,752 ක්වූ නොසැසඳුණු වෙනසක් පැවතුණි. | ඉදිරි වර්ෂය තුළ නිරවුල් කර ගැනීමට කටයුතු කරන බව. | නොසැසදීම් වලට හේතු සොයා නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

1.6.4 **විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විෂය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| ------ | ------- | ----------- | ----------- | ---------- |
| ජල බිල්පත් | 3,888,743 | සමුච්චිත අරමුදලට ගැලපීමට හේතුව | නිවැරදිවම ජල ණයගැති ශේෂය ලබාගෙන ගිණුම්ගත කිරීමටත් ලබන වර්ෂයේ සිට ක්‍රියා කරන බව. | වෙනසට හේතුව කුමක්ද යන්න අනාවරණය කළ යුතුය. |

1.7 **අනුකූල නොවීම්**

### 1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි571(2) | තැන්පතු රාජ්‍ය ආදායමට බැර කිරීමට පෙර විමසීම් කර බැලිය යුතු වුවත් වර්ෂ 2ක ඉක්මවූ රු. 6,309,706ක් එවැනි විමසීමකින් තොරව සමාලෝචිත වර්ෂයේ ආදායමට බැර කර තිබුණි. | මුදල් රෙගුලාසි අනුවම ක්‍රියා කිරීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළයුතුය. |
| (ආ) | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 මාර්ගෝපදේශය | සමාලෝචිත වර්ෂය තුලදී ආරම්භ කර තිබූ නව ව්‍යාපෘති 70 කට අදාල ඉදිකිරීම්/ වැඩ ඇතුලත් කර ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | බස්නාහිර පළාත් පාලන කොමසාරිස්ගේ 2020 දෙසැම්බර් 03 දිනැති අංක LGD/13/2016(1) දරන චක්‍රලේඛය | බදු ගිවිසගත් දිනෙන් සෑම වර්ෂ 03කට වරක් මාසික කුළිය රජයේ තක්සේරුකරුගේ තක්සේරුව මත ප්‍රතිශෝධනය විය යුතු වුවද කොටුගොඩ පාර පාලම අසල කඩ කාමර බදුදීම සම්බන්ධයෙන් තක්සේරුවක් ආසන්න වර්ෂ ද3 ඇතුළත සංශෝධනය වී ඇති බව විගණනයට අනාවරණය නොවීය. | ඉදිරියේදී එම අයිතිය පිළිබඳ ගැටලුව නිරාකරණය කර තක්සේරුවට යොමු කිරීමට කටයුතු කරන බව. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

1.7.2 **බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 වර්ෂයේ සිට පැවත එන ගෙවියයුතු එකතු කළ බදු රු.218,245 පියවීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි | ඉදිරියේදී ලෙජර් ශේෂය නිරවුල් කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි. | බදු පියවීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්මවූ ආදායම රු. 147,401,280ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්ම වූ ආදායම රු රු. 177,782,346 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| .............. | .............. | ........... | ............ | ............ | .................. | ............ | ........... | ............... |
| | රු. 000' | රු. 000' | රු. 000' | රු. 000' | රු. 000' | රු. 000' | රු. 000' | රු. 000' |
| වරිපනම් හා බදු | 152,900 | 151,740 | 150,753 | 55,909 | 153,675 | 156,364 | 149,987 | 56,245 |
| කුලී | 16,538 | 11,587 | 14,008 | 931 | 8,550 | 11,939 | 12,031 | 882 |
| බලපත්‍ර ගාස්තු | 6,151 | 4,899 | 4,899 | - | 5,321 | 4,965 | 4,965 | - |
| වෙනත් ආදායම් | 146,901 | 205,849 | 196,041 | 32,460 | 118,025 | 133,233 | 129,081 | 18,763 |
| | ----------- | --------- | ----------- | ------------ | ------------ | ---------- | --------- | --------- |
| | 322,490 | 374,075 | 365,701 | 89,300 | 285,571 | 306,501 | 296,064 | 75,890 |
| | ======== | ===== | ====== | ====== | ======= | ===== | ===== | ===== |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ව්‍යාපාර බදු හා කර්මාන්ත බදු වශයෙන් ඒකක 487 කින් රු.557,000ක් අය කර ගෙන නොතිබුණි. | නිලධාරී පුරප්පාඩුව නිසා අය කර ගැනීම ප්‍රමාද වීමට හේතු වී ඇති බව. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව විසින් 2023 වර්ෂයට අදාලව උත්සව/ රැස්වීම් ශාලා වෙන්කිරීම් ගාස්තු අයකිරීම සඳහා ගැසට් නිවේදනයක් නිකුත් කර තිබූ නමුත් එම ගාස්තු අයකිරීමට හැකිවන පරිදි වූ අතුරු ව්‍යවස්ථාවක් වැළදගැනීමක් හෝ ඊට අදාල අතුරු ව්‍යවස්ථාවක් සකස් කොට අනුමත කර ගැනීමක් හෝ සිදු කර නොතිබුණි. | ඉදිරියේදී ඒ අනුව කටයුතු කරන බව. | අතුරු ව්‍යවස්ථාවක් වැළඳගැනීමට හෝ නව අතුරු ව්‍යවස්ථාවක් සකස් කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2023 වර්ෂයේදී ලැබී තිබුණු මහජන පැමිණිලිවලින් විසඳා නොතිබුණු මහජන පැමිණිලි 05ක් විය | හැකි ඉක්මනින් නිම කිරීමට කටයුතු කරන බව. | මහජන පැමිණිලි හැකි ඉක්මනින් විසඳීමට කටයුතු කළ යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ 3 වගන්තියට පටහැනිව සභා බල ප්‍රදේශයේ මංමාවත්වලට පෙනෙන ලෙස වෙළඳ ස්ථාන භූමිවල සවිකර තිබූ ප්‍රචාරක දැන්වීම්වලට සභාව විසින් අදාල පරිදි ගාස්තු අයකර බලපත්‍ර නිකුත් කර නොතිබුණු අවස්ථා 04 ක් සෝදිසි පරීක්ෂාවේදී අනාවරණය වූ අතර සීදුව මංසන්දියේ මීටර් 150 ක් වැනි දුර ප්‍රමාණයක ගාස්තු අය නොකළ දැන්වීම් පුවරු 23 ක් හඳුනාගන්නා ලද අතර ඒ අනුව දළ වශයෙන් සභාවට රු.333,950ක ආදායමක් අහිමිවී තිබුණි. | වෙළඳ ස්ථානවල වෙළඳාම සම්බන්ධ දැන්වීම් වලින් අය කර ගැනීම සඳහා සමීක්ෂණය කරමින් පවතින බව. | අතුරු ව්‍යවස්ථාව ප්‍රකාරව කටයුතු කළ යුතුය |
| (ආ) | 2023 වර්ෂයේ ඉඩම් කට්ටිකර විකිණීමකදී සභාව වෙත හිමිවී තිබූ පර්චස් 88.8ක පොදු පහසුකම් ඉඩමේ වටිනාකම ගිණුම්ගත කිරීමේදී රු.1,250,000ක් වූ එක පර්චසයක අවම විකුණුම් මිල හෝ සැලකිල්ලට නොගෙන ලැබී තිබුණු ඔප්පු වටිනාකම වූ රු.100,000ක් ඉඩමේ වටිනාකම ලෙස ගිණුම්ගත කර තිබුණි. ඒ අනුව රු.1,250,000ක් වූ එක පර්චසයක අවම විකුණුම් මිල සැලකිල්ලට ගැනීමේදී පර්චස් 88.8ක පොදු පහසුකම් ඉඩමෙහි වටිනාකම රු.111,000,000ක් ක් විය යුතු වූයෙන් සභාවට හිමිවී තිබූ ඉඩමේ වටිනාකම රු. 110,900,000කින් අවතක්සේරු වී තිබුණි. | ඉදිරි වර්ෂයේදී වත්කම් ප්‍රත්‍යාගණනයක් සිදු කර ඉඩමට අදාළව සාධාරණ අගයක් අවසන් මූල්‍ය ප්‍රකාශන තුළ දැක්වීමට කටයුතු කරන බව. | නිවැරදි වටිනාකම් තක්සේරු කර ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සභාව වෙත දිගු කාලයක සිට ලැබිය යුතු අධිභාර වූ රු.1,677,409ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | එම මුදල ඉදිරියේදී නිරවුල් කර ගැනීමට කටයුතු කරන බව. | නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2022 ජනවාරි 27 දිනැති අංක 2264/18 දරන ගැසට් නිවේදනය අනුව සභාව විසින් පරිසර බලපත්‍ර ලබාදිය යුතු ආයතන හඳුනාගැනීම සඳහා 2023 වර්ෂයට අදාලව සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. | 2023 වර්ෂයට අදාළව සිදු කරන ලද වෙළඳ බලපත්‍ර සමීක්ෂණයේ දත්ත උපයෝගී කරගෙන ලබා ගැනීමට පියවර ගෙන ඇති බව. | සිදුකල සමීක්ෂණය මිගින් පරිසර බලපත්‍ර ලබා දිය යුතු ආයතන වෙනම හඳුනාගෙන ලේඛන ගත කළ යුතුය. |
| (ඉ) | එකතු වටිනාකම රු.328,000ක් අය විය යුතුව පැවති ආයතන 310ක් වෙළඳ බලපත්‍ර නොමැතිව කටයුතු කිරීමට සැලැස්වීම නිසා ව්‍යාපාර පිළිබඳ නියාමනයක් සිදු නොවන හෙයින් මහජනයා පිළිබඳ වගකීම පැහැර හැරීම නගර සභා ආඥා පනතට පටහැනි වීමක් විය. | ඉදිරි වර්ෂයේ සිට සියලුම කොට්ඨාශ වල වෙළඳ බලපත්‍ර ලබා නොගන්නා ආයතන සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව. | ව්‍යාපාර පිළිබඳ නිසි නියාමනයක් සිදුකිරීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | සභාවේ පැවති ගොඩනැඟිලිවලට අදාළව තක්සේරු දෙපාර්තමේන්තුවෙන් තක්සේරුවක් ලබා ගැනීමකින් තොරව සභාව විසින් සමාලෝචිත වර්ෂයේදී තක්සේරු මණ්ඩලයක් මඟින් තක්සේරු කර ලබා දී තිබූ ප්‍රත්‍යාගණන වටිනාකම රු. 20,996,166 ක් ගිණුමට ගොඩනැගිලි වටිනාකම ලෙස සැලකීම කළමනාකරණ අකාර්යක්ෂමතාවයක් විය. | පිළිතුරු ලබා දී නැත. | තක්සේරු දෙපාර්තමේන්තුවෙන් තක්සේරුවක් ලබා ගත යුතුය. |

### 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නගර සභා මූල්‍ය පරිපාලනයට අදාල ගිණුම් කටයුතු පිළිබඳ රීති 406 ප්‍රකාරව නිශ්චල දේපල 07ක් බදු දීම සඳහා රජයේ හෝ පෞද්ගලික වරලත් තක්සේරුකරුවෙකු මගින් සහතික කරන ලද වටිනාකම් පදනම් කර ගෙන නොතිබුණු අතර නගර සභා මූල්‍ය රීති 314(1) , 335 , 341 ප්‍රකාරව කටයුතු කර ද නොතිබුණි. | 2024 වර්ෂය සඳහා බදුකරු තෝරාගෙන ඇති බැවින් 2025 ප්‍රසම්පාදන වර්ෂය සඳහා එම තක්සේරුව යොදා ගැනීමට නියමිත බව. | නගර සභා මූල්‍ය රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | කටුනායක නව වෙළඳ සංකීර්ණයේ බදු දී තිබූ කඩ කාමර විවෘත නොකිරීම සම්බන්ධයෙන් සභාව විසින් කිසිදු අධීක්ෂණයක් සිදු කර නොතිබුණු හෙයින් වෙළඳ සංකීර්ණය ජන ශූන්‍ය වූ අතර ඵලදායි කටයුත්තක් සඳහා යොදවා ගත හැකිව පැවති එම ගොඩනැගිල්ලෙහි බිම් මහලෙහි විශාල භූමි ප්‍රමාණයක් ද කිසිදු ප්‍රයෝජනයකට ගෙන නොතිබුණි. | සංවර්ධන කටයුතු වලින් අනතුරුව සභාවට ආදායමක් ලබා ගැනීමට කටයුතු කරන බව. | සභාව සතු වත්කම් ඵලදායීව යොදාගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | සීදූව නව වෙළඳ සංකීර්ණයෙහි කඩ කාමරවලට අදාල ගිවිසුම්හි අංක 17 දරන කොන්දේසිය අනුව කිසිවිටෙක කඩ කාමරය බදු දීමනාකරුගේ ලිඛිත අවසරය නොමැතිව වෙනත් අයට පැවරීම, උගස් කිරීම, අතුරු බද්දට දීම හෝ කුළියට දීමක් හෝ වන පරිදි අන්සතු නොකළ යුතු වුවද බදු දීමනාකරුගේ ලිඛිත අවසරයකින් තොරව අතුරු බදු ලබාදී තිබුණු බව පසුව හඳුනාගෙන තිබූ කඩ කාමර 07ක් සඳහා ගිවිසුම්ගත වී තිබූ නමුත් 2020 දෙසැම්බර් 03 දිනැති අංක LGD/13/2016(1) දරන චක්‍රලේඛය ප්‍රකාරව පැවරුම් ගාස්තුවක් හෝ ලබාගත් බවට සාක්ෂි ඉදිරිපත් නොවීය. | බදු ගැණුම්කරුවන් සඳහා ගිවිසුම හා චක්‍රලේඛය ප්‍රකාරව ඉදිරියේදී කටයුතු කරන බව. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඈ) | බදුකරු නොවන වෙනත් පාර්ශවයන් විසින් ව්‍යාපාර කර ගෙන යනු ලබන සීදූව නව වෙළඳ සංකීර්ණයෙහි කඩ කාමර 09ක් සම්බන්ධයෙන් සභාව විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | බදුකරුවන් සඳහා ගිවිසුම අනුව ඉදිරියේදී කටයුතු කරන බව. | ගිවිසුම අනුව කටයුතු කළ යුතුය. |

### 3.4 ප්‍රසම්පාදන කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | එකතුව රු. 2,980,879ක් වූ මිලදීගැනීම් අවස්ථා 14ක් 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4.3 (ඈ) පටහැනිව ද ඉන් රු. 2,336,636කට අදාල අවස්ථා 12ක් එම සංග්‍රහයට වූ කාර්යය සංග්‍රහයේ 6.3.6 ට පටහැනිව ද රු.41,391ක් වූ එක් අවස්ථාවක් මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.6ට පටහැනිව ද සිදු කර තිබුණි. | අවස්ථා 04 කට අදාළව ලියාපදිංචි ගැණුම්කරුවන්ගේ පමණක්ම මිල කැඳවීම සිදු කර ඇත. නමුත් අවස්ථා 09කදීම යම් යම් හේතූන් මත ලියාපදිංචි සැපයුම්කරුවන්ගේ මිල කැඳවීම සිදු කර නොමැති බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුය |
| (ආ) | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.3.2 (ඈ) ,2.6.1(අ)(ii) හා 7.11.1 යන මාර්ගෝපදේශවලට පටහැනිව රු.392,000 ක් ගෙවා ඡායා පිටපත් යන්ත්‍රයක් මිලදී ගෙන තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ එන 2.3.2 (ඈ) පරිදි විධිමත්ව තාක්ෂණ ඇගයීම් කමිටුව පත් කර නොගැනීම දුර්වලතාවයක් ලෙස පිළිගන්නා බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2022 වර්ෂයේදී අන්තර්ජාලය ඔස්සේ ගෙවීම් කිරීමට මෘදුකාංග 07ක් ස්ථාපිත කිරීම සඳහා පුද්ගලික සමාගමක් වෙත රු.4,985,000ක් ගෙවා තිබුණි. මේ පිළිබඳව පහත කරුණු නිරීක්ෂණය විය. | | |
| 1 | වටිනාකම රු.3,565,000 ක් වූ මෘදුකාංග පද්ධති 05ක් 2023 නොවැම්බර් 24 විගණිත දින වන විටත් ක්‍රියාත්මක තත්ත්වයට පත්කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම අයිතම සියල්ල ඉතා ඉක්මනින් සක්‍රිය කර ගැනීමට කටයුතු කරන බව. | මෘදුකාංග පද්ධති ක්‍රියාත්මක තත්ත්වයට පත්කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| 11 | ගිවිසුමෙහි සඳහන් ඡේදවලට පටහැනිව සභාව විසින් සම්පූර්ණ මුදලම ගෙවා අවසන් කර තිබූ අතර නගර සභාවේ නිලධාරීන්ට පුහුණුවීම් ලබා දී නොතිබුණි. | ආදායම් අංශ ප්‍රධානී විසින් ලිපිගොනුවේ පිටු අංක 120 පරිදි අදාළ පුහුණුවීම් නිසි පරිදි ලබා ගත් බවට නිර්දේශ ලබා දීමෙන් පසුව ගෙවීම සිදු කර ඇති බව.. | නිසි පුහුණුවක් අදාල ආයතනය මගින් ලබා ගත යුතුය. |

## 3.5 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වැසිකිළි පද්ධතියක් ඉදිකිරීමේදී 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.1(ඇ), 4.2.2, 6.2.1(අ) , 6.2.2 මාර්ගෝපදේශවලට පටහැනිව කටයුතු කර තිබුණි තවද ව්‍යාපෘතියට අදාලව පිළියෙල කර තිබූ ඇස්තමේන්තුවෙහි අයිතම 45 යටතේ වර්ග අඩි 140.75ක ඇලුමිනියම් පාර්ටිෂන් සඳහා රු.192,546ක් ඇස්තමේන්තු කර තිබුණ ද කොන්ත්‍රාත්කරුවෙකු තෝරා ගැනීමට පෙර එම වැසිකිළි පද්ධතිය වෙත ප්‍රවේශ වීම සඳහා වර්ග අඩි 164.44ක ඇලුමිනියම් පාර්ටිෂන් යොදාගනිමින් කොරිඩෝවක් වෙන්කර තිබූ බව භෞතිකව නිරික්ෂණය විය. ඒ අනුව සභාව විසින් ප්‍රසම්පාදනයෙන් බැහැරව ඇස්තමේන්තුවෙහි ඇතුලත් කාර්යයක් කොන්ත්‍රාත්කරුවෙකු වෙත ලබාදී ඉටුකරවා ගෙන තිබුණි. | ඉදිරියේදී එම කටයුතු විධිමත් ක්‍රමවේදයක් ඔස්සේ සිදු කිරීමට එකඟ වන බව. දීර්ඝ නිවාඩුවක් පැවති දිනයන්හි කාර්යාලයීය කටයුතු වලට බාධා සිදුවීම අවම කර ගැනීම අපේක්ෂාවෙන් සද්භාවයෙන් මෙය ඉටු කළ බව. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුය. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 3.6 නිෂ්ක්‍රිය වත්කම්

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2019 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා ධාවන තත්වයේ නොපවතින වාහන 07ක් අලුත්වැඩියා කර ධාවනය සඳහා යොදා නොගැනීම නිසා තවදුරටත් දිරාපත් වෙමින් පැවතිණි. | අලුත්වැඩියාව සඳහා සුදුසුම ට්‍රැක්ටර් රථ අලුත්වැඩියාවටත්, ධාවනයට නුසුදුසු මට්ටමේ පවතින ට්‍රැක්ටර් රථ අපහරණය කිරීමටත් අපේක්ෂිත බව. | අලුත්වැඩියා කිරීම් නිසි ලෙස සිදුකර වත්කම් උපරිම කාර්යක්ෂමතාවයෙන් භාවිතා කළ යුතුය. |
| (ආ) | බස්නාහිර පළාත් සන අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියෙන් 2021 මාර්තු 20 දින සභාවට ලැබී තිබුණු අපහරණ තත්ත්වයේ පැවතුණු මෝටර් රථය අලුත්වැඩියා වෙනුවෙන් 2021 හා 2022 වර්ෂවල එකතුව රු.691,529ක් වැයකර තිබුණ ද එදින සිට දින 68 ක් කිලෝ මීටර් 4,595ක් පමණක් ධාවනය කර තිබූ අතර 2023 වර්ෂයේ දී රු.45,550ක් වැය කර ක්ලච් පද්ධතිය ද අලුත්වැඩියාකර තිබියදී 2023 වර්ෂය පුරා ධාවනය කර නොතිබුණි. | මෙම තත්ත්වය ඉදිරි කාලය තුළ අවම කරගෙන වාහන උපරිම කාර්යක්ෂමතාවයකින් ධාවනයට එක් කිරීමට කටයුතු කරන බව. | වාහන පරිපාලනය පිළිබඳව නිසි අධීක්ෂණයක් සිදුකරමින් උපරිම කාර්යක්ෂමතාවයෙන් වත්කම් භාවිතා කළ යුතුය. |

### 3.7 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 දෙසැම්බර් 31 දිනට සභාවේ කාර්යමණ්ඩල විස්තර අනුව ද්විතික මට්ටමේ තනතුරු 3ක පුරප්පාඩු 7ක් ද තනතුරකට අදාල අතිරික්ත 1ක්ද සහ ප්‍රාථමික මට්ටමේ තනතුරු 3ක පුරප්පාඩු 22ක් ද, පවතින බව නිරීක්ෂණය විය. | පුරප්පාඩු සඳහා බඳවා ගැනීම් රජය මඟින්ම නවතා ඇති බැවින් එම පුරප්පාඩු එසේම පවතින බව. | සභාවේ රාජකාරි වල කාර්යක්ෂමතාවයට බලපෑමක් ඇති නොවන අයුරින් කාර්යමණ්ඩලය කළමනාකරණය කර ගැනීමට කටයුතු කළ යුතුය. |